## බොපෙ- පෝද්දල ප්‍රාදේශීය සභාව

දකුණු පළාත් රාජ්‍ය සේවයේ බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරුවලට පුරප්පාඩු වෙනුවෙන් මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචි ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *සේවා ශ්‍රේණිය සහ ශ්‍රේණිය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *බඳවා ගැනීමට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද/අමතර සුදුසුකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|---|---|
| 01 | රියදුරු | ප්‍රාථමික ශිල්පීය III ශ්‍රේණිය | 01 | රු. 25,790 - 10 x 270 -10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 | * දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් ඕනෑම විෂයයන් 06 ක් සමත් වී තිබීම<br>* මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් හා නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුය.<br>* රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද ලබා තිබිය යුතුය. |
| 02 | බර උපකරණ යන්ත්‍ර ක්‍රියාකරු | ප්‍රාථමික - අර්ධ ශිල්පීය | 01 | රු. 25,790 - 10 x 270 -10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 | * අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් (06) ක් සමත් වී තිබීම.<br>* අදාල තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන් හි (NVQ) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවක් ලබා තිබීම.<br>* අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |

2. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

i. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවන අතර, ඔවුන් අදාළ දෙපාර්තමේන්තුවේ ප්‍රධානිය මගින් තම අයදුමපත්‍රය ඉදිරිපත් කළ යුතුය.

ii. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

iii. අනු අංක 01හි සඳහන් රියදුරු තනතුර සඳහා අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ගාල්ල දිස්ත්‍රික්කයේ පූර්වාසන්න වසර 05ක අනුගාමී වසර 03 ක් ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.

iv. අනෙක් තනතුරු සඳහා අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක කාලයක් ගාල්ල දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතුය.

v. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් සහ තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

vi. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබුවෙකු නොවිය යුතු ය.

vii. රජයේ සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.

viii. අදළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

ix. අයදුම්කරුවන් එක් එක් තනතුර ඉදිරියෙන් දක්වා ඇති බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම්, අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. එතකුදු වුවත්, තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතුය.

ii. වැන්දඹු අනත්දරු/වැන්දඹ පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

iii. බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ. දැනටමත් රාජ්‍ය සේවයේ ස්ථිරවී ඇති සේවකයින් එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් වේ.

iv. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුය.

v. එක් එක් තනතුරුවලට අදාළ වැටුප් පරිමාණයන් 2016.01.01 වැනි දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි II වැනි උපලේඛනය අනුව වේ. එම වැටුප් පරිමාණ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වනුයේ 2020.01.01 වැනි දින සිටය.

vi. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ දැනට සේවයේ නියුතු තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/ලියාපදිංචි පදනම මත සේවය කරනු ලබන සේවකයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

vii. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවල ද, දකුණු පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලටද දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර පනවනු ලබන වෙනත් නියෝගවලටද, දෙපාර්තමේන්තු නියෝගවලටද, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝග වලට අනුකූලව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

viii. එසේම රියදුරු තනතුර සඳහා බඳවා ගනු ලබන සේවකයින් දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් 2012.01.02 වැනි දින අනුමත කරන ලද අංක 238 දරන දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආයතනගත මෝටර්රථ රියදුරන් සඳහා වන රියදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයට සහ එය වරින් වර නිකුත් කරන රෙගුලාසි හා සංශෝධනයන්ට අනුකූලව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

ix. අනෙකුත් තනතුර සඳහා බඳවා ගනු ලබන සේවකයින් දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් 2013.04.16 වැනි දින අනුමත කරන ලද 239 දරන දකුණු පළාත් රාජ්‍ය සේවයේ ආයතනගත කණිෂ්ඨ සේවක සේවයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට අදළ බඳවා ගැනීමේ පටිපාටියේ නියෝගවලට සහ එයට වරින්වර නිකුත් කරන රෙගුලාසි සහ සංශෝධනයන්ට අනුකූලව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

x. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමෙ බලය බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :*

1. රියදුරු තනතුරු සඳහා බඳවා ගැනීමේ ක්‍රමවේදය :

* සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සහ වෘත්තීය ප්‍රවීණතා තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ.

* එම පරීක්ෂණ සඳහා පහත සඳහන් ආකාරයට ලකුණු දෙනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා :

| | | | |
|---|---|---|---|
| අ.පො.ස. (සා.පෙළ) සාමාන්‍ය සාමාර්ථ සඳහා | (8 x 1) | - | 8 හෝ |
| අ.පො.ස. (සා.පෙළ) සම්මාන සාමාර්ථ සඳහා | (8 x 2) | - | 16 (උපරිම) |
| අ.පො.ස. (උ.පෙළ) සමත්වීම | | - | 4 |
| වෘත්තියට අදාළ දැනුම | | - | 10 |
| පෞරුෂත්වය | | - | 5 |
| වෘත්තියට අදාළව පුහුණුවක් හෝ සේවා පළපුරුද්දක් ලබා තිබීම | | - | 15 |
| (වසරකට ලකුණු 2ක බැගින්) - මුළු එකතුව | | - | 50 |

*සටහන :* සමත්වීම සඳහා 40% ක් (ලකුණු 20) හෝ ඊට වඩා ලකුණු ලබාගත යුතුය. වෘත්තීය ප්‍රවීණතා තහවුරු කර ගැනීමේ පරීක්ෂණය සඳහා - 50

*සටහන :* සමත් වීම සඳහා 40% ක් (ලකුණු 20) හෝ ඊට වඩා ලකුණු ලබාගත යුතුය.

II. යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා බඳවා ගැනීමේ ක්‍රමවේදය :

* අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව අදාළ බඳවා ගැනීමේ පටිපාටියට අනුව පහත සඳහන් පරිදි ලබා ගන්නා උපරිම ලකුණු මත බඳවා ගනු ලැබේ :

| | *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. | අධ්‍යාපන සුදුසුකම් | 30 | |
| 02. | වෘත්තීය සුදුසුකම් | 10 | |
| 03. | පළපුරුද්ද | 10 | 50% |
| 04. | සභා බල ප්‍රදේශයේ පදිංචිය | 45 | |
| 05. | සම්මුඛ පරීක්ෂණයෙහි දක්වන කුසලතාව | 05 | |
| | එකතුව | 100 | |

*සටහන :*

1. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දීම සිදු කෙරේ.
2. මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් අතුරින් ව්‍යුහගත පරීක්ෂයේ දී ලැබූ ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

05. *අයදුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය අනුව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර ගන්නා ලද අයදුම්පත් 2018.12.28 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ "ලේකම්, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව, කලේගාන" යන ලිපිනයට පහත සඳහන් ලියවිලි වල සහතික කරනලද පිටපත් සමග අමුණා ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. දක්වා ඇති උපදෙස් වලට පටහැනි අසම්පූර්ණ, අපැහැදිලි මෙන්ව නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතුය.)

05. *අයදුම්පත සමග එවිය යුතු ලියවිලි :*

1. උප්පැන්න සහතිකය,
2. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්,
3. අධ්‍යාපන සහතික/පාසැල් හැරයාමේ සහතික,
4. ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචිය සනාථ කිරීමේ සහතිකය (මාස 06 ක් තුළදී ලබා ගත්),
5. සාපරාධී වරදක් සම්බන්ධයෙන් මෙතෙක් උසාවියකින් වරදකරුවෙකු කර නැති බව හා එවැනි වරදක් සම්බන්ධයෙන් දැනට පරීක්ෂණයට භාජනය වූ අයෙකු නොවන බවට තහවුරු කරන පොලිස් සහතිකය,
6. වෘත්තීය හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකය (තිබේ නම් පමණක්),
7. මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක්.

06. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

මෙම නිවේදනයේ දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටලුවක් වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට ගත යුතුය.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති සියලුම කරුණු පිළිබඳ අවසන් තීරණය බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපති සතු වන්නේය.

දිල්රුක් එන්. අබේකෝන්.
සභාපති.
බෝපෙ පොද්දල ප්‍රාදේශීය සභාව.

2018 ක් වූ නොවැම්බර් මස 14 වැනි දින.
බොපෙ පෝද්දල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

ආදර්ශ අයදුම්පත්‍රය

**බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව**

..............................................තනතුර සඳහා අයදුම්පත්‍රය

01. I මුලකුරු සමග නම :.............................................................

II මුලකුරුවලින් හැඳින්වෙන නම :.............................................................

02. ස්ථිර පදිංචි ලිපිනය :.............................................................

03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :.............................................................

04. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :.............................................................

05. උපන් දිනය ඃ අවුරුද්ද :.....................මාසය :..................... දිනය :.....................

06. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස (2018.12.28 දිනට) :.............................................................

අවුරුදු :..................... මාස :..................... දින :.....................

07. ස්ත්‍රී/පුරුෂ භාවය :.............................................................

08. ජාතික හැඳුනුම්පත් අංකය :.............................................................

09. දුරකථන අංකය :.............................................................

10. විවාහක /අවිවාහක බව :.............................................................

11. ඔබ ශ්‍රී ලාංකිකයෙක් ද ? එසේ නම් පරම්පරාවෙන්ද ? යන වග :.............................................................

12. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාගය පිළිබඳ විස්තර) :

12.1 අවසන් වරට සමත් වූ පන්තිය :...........................................................

12.2 අ.පො.ස. (සා. පෙළ) විභාගය ፡

(i) වර්ෂය:..................... මාසය :..................

(ii) විභාග අංකය :..............................

(iii) ප්‍රතිඵල ፡

| විෂයය | සාමාර්ථය |
| --- | --- |
| | |
| | |
| | |
| | |
| | |

| විෂයය | සාමාර්ථය |
| --- | --- |
| | |
| | |
| | |
| | |
| | |

12.3 අ.පො.ස. (උ. පෙළ ) විභාගය ፡

(i) වර්ෂය :..................... මාසය :.....................

(ii) විභාග අංකය:..............................

(iii) ප්‍රතිඵල ፡

| විෂයය | සාමාර්ථය |
| --- | --- |
| | |
| | |
| | |
| | |
| | |

13. වෘත්තීය හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුය) :.......................................

14. ඔබ දැනටමත් රජයේ රැකියාවක නියුතු නම් ፡

I. දැනට දරන තනතුර :..........................................

II. සේවය කරන ස්ථානය :..........................................

III. පත්වීමේ දිනය හා ස්වභාවය:..........................................

15. ඔබ කවරදක හෝ සාපරාධී වරදක් හෝ චෝදනාවක් සම්බන්ධයෙන් අධිකරණයෙන් වරදකරුවෙකු කර ඇත්ද?

එසේ නම් තොරතුරු :..........................................

16. අයදුම්කරුගේ සහතිකය ፡

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනුම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් වීම් ලැබීමෙන් පසු එවැනි කරුණක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බවත් දනිමි.

....................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :.........................

(මෙම කොටස අදාළ වන්නේ රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට පමණි.)

*දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

..........................................මහතා/මෙනවිය/මහත්මිය මෙම ආයතනයේ.......................................... වශයෙන් සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදයක වන බවත්, ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති බවත් ඉදිරියට විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

....................
ආයතන ප්‍රධානියගේ අත්සන.

දිනය :........................

11-1429